# ථෙර - ථෙරී අපදානය පිළිබඳ විමර්ශනයක්

ආචාර්ය පාතේගම ඥානාරාම හිමි.

ථෙරවාද සූත්‍ර පිටකයේ ඛුද්දක නිකාය පර්යාපන්න අපදාන පාලිය ථෙර අපදාන හා ථෙරී අපදාන යනුවෙන් කොටස් දෙකකින් යුක්ත වේ. පසළොස් වැදෑරුම් ඛුද්දක නිකායෙහි වෙන වෙනම ග්‍රන්ථ දෙකක් ලෙස ථෙර ගාථා හා ථෙරී ගාථා දක්වා ඇතත් එවැනි බෙදුමකට භාජනය කළ හැකි ථෙර - ථෙරීන් පිළිබඳ අපදානයන්ගෙන් සමන්විත ථෙර අපදානය හා ථෙරී අපදානය එක ම කෘතියක් ලෙස ඛුද්දක නිකාය ග්‍රන්ථනාමාවලියේදී සළකනු ලැබ ඇත.

එසේ වුව ද දීඝ භාණකයින් විසින් පිළිගන්නා ලද ඛුද්දක නිකාය පර්‍යාපන්න ග්‍රන්ථනාමාවලියෙහි අපදාන පාලිය සඳහන් නොවීම විශේෂයෙන් සැළකිය යුත්තකි.[1] ඔවුන් එම කෘතිය ප්‍රාමාණිකත්වයෙන් පිළිගැනීමට අකමැති වීම නිසා හෝ දීඝභාණක නාමාවලිය සැකසෙන අවස්ථාව වන විට අපදාන පාලිය සම්පාදනය වී නො තිබීම නිසා හෝ එසේ වුවා විය හැක. කෙසේ වුව ද මජ්ඣිම භාණකයින් විසින් සකසන ලදැයි බුදුගොස් මාහිමියන් විසින් තබා ඇති ත්‍රිපිටක ග්‍රන්ථනාමාවලිය අනුවත් සාම්ප්‍රදායික ථෙරවාද පිළිගැනීම අනුවත් අපදාන පාලිය වූ කලී සූත්‍රපිටකාගත ඛුද්දක නිකාය පර්‍යාපන්න තෙළෙස්වන ග්‍රන්ථය වේ.[2] දීඝභාණක නාමාවලියට අනුව ඛුද්දක නිකායෙහි ඇතුළත්වන්නේ

1. ජාතක
2. නිද්දේස
3. පටිසම්භිදා මග්ග
4. සුත්ත නිපාත

5. ධම්මපද 6. උදාන

7. ඉතිවුත්තක 8. විමාන වත්‍ථු

9. පෙත වත්‍ථු 10.ථෙර ථෙරි ගාථා පමණකි.

## අපදාන පාලියේ සැලැස්ම හා සන්ධාරය

අපදාන යන්නෙහි අර්ථය පැහැදිළි කරන අපදානට්ඨ කථාව එය 1. කාරණ 2.ගහණ 3. අපගමන 4.පටිපාටි 5. අක්කොසන යන අර්ථ පහත යෙදෙන බව පවසා මෙහි දී අපදාන ශබ්දය **කාරණ** යන අරුතෙහි ම යෙදෙන බව අවධාරණය කරමින් **බුද්ධාපදානානි බුද්ධ කාරණානී"ති අත්‍ථො** යනුවෙන් අරුත් බෙණෙයි.[3] එහෙත් පැහැදිළි ලෙස ම එහි ගම්‍යාර්ථය මීට වඩා වෙනස් බව කිව යුතු නොවේ. බෞද්ධ සංස්කෘතියේ එය දැක්වෙන්නේ අවදාන යනුවෙනි. වීර ක්‍රියාව හෙවත් ශ්‍රේෂ්ඨ ක්‍රියාව ඉන් කියවේ. අර්ථය වැඩි දුරටත් විස්තෘත කිරීමෙන් අර්හත්වය ලැබීම සඳහා ඒ ඒ ථෙර - ථෙරීන් විසින් පෙර අත් බැව්හිදී කරන ලද ශ්‍රේෂ්ට ක්‍රියා අදහස් කරනු ලැබ ඇත.:[4]– අපදාන පාලියේදී මෙම අර්ථය විශේෂයෙන් වාච්‍ය වේ.

අපදාන පාලියේ බෞද්ධ සංස්කෘත ප්‍රතිරූපය විවිධ නම්වලින් හැඳින්වෙන අවදාන කෘති රැසකින් සමන්විත වේ. සාමාන්‍යයෙන් ක්‍රි:ව: 2 වන සියවස පමණ සිට ඇරඹෙන බෞද්ධ සංස්කෘත සාහිත්‍යයේ අවදාන සාහිත්‍යාංශය කෘති රාශියකින් සමන්විත වන අතර එහි ප්‍රථම කෘතිය අවදානය ශතකය ලෙස සළකනු ලැබේ.[5]

වග්ගී 59 කින් යුත් පද්‍යකෘතියක් වන අපදාන පාලිය කොටස් හතරකින් යුක්තවේ. ඒවා නම්; 1. බුද්ධාපදාන 2. පච්චෙක බුද්ධාපදාන 3. ථෙරාපදාන 4. ථෙරි අපදාන යනු එම කොටස් ය. මුල් වග්ගී 55 තෙරුන් 550ක ගේ අපදානයන්ගෙන් සමන්විත වන අතර බුද්ධාපදාන හා පච්චෙක බුද්ධාපදානයද ඊට ම ඇතුළත්වේ. අවසාන වග්ගී 4 ස්ථවිරාවන් පිළිබඳ අපදාන



40 කින් සමන්විත වේ. එහි සඳහන් වන නවවන පඤ්චදීපිකාපදානය ඉතා සුළු වෙනස් කම් සහිතයි. පඤ්චදීපදායිකා පදානය යනුවෙන් පසළොස්වන අවදානය ලෙස නැවතත් දැක්වේ. බුදුරදුන්ගේ අපදාන ඇතුලත් නොවුව හොත් මෙම කෘතිය අසම්පූර්ණ යැයි සිතීමෙන් දෝ බුද්ධාපදාන හා පච්චෙක බුද්ධාපදාන ද ථෙරාපදානයට ඇතුලත් කර ඇති බව පෙනේ. බෝසතුන් මනෝප්‍රණිධාන පිරූ ආකාරයත් අනතුරුව පාරමිතා පිරූ ආකාරයත් බුද්ධාපදානයෙහි විස්තර වෙයි. අප්‍රමාණ බුදුවරුන් ගැන මෙහි කියවෙන හෙයින් (ධම්ම රාජා අචින්තියා) බුද්ධ සංකල්පය හා බුද්ධ විද්‍යාව දියුණු වූ අවධියක් ඉන් නිරූපණය වන බවට විවාදයක් නැත. ගාථා 81 ක් සමන්විත මෙහි සමත්‍රිංශත් පාරමිතා පූරණයේදී බෝසතුන් විසින් කරන ලද විවිධ පුණ්‍ය ක්‍රියාවන්ට ප්‍රමුඛස්ථානය දී වර්ණනා කර ඇත.

පච්චේක බුද්ධාපදානයෙහි සුත්ත නිපාතයට අයත් මුණි ආදර්ශය ගැබ් කොට ඇති ඛග්ග විසාණ සූත්‍රයේ ගථා 41ට මුළින් ගාථා 8කුත් අගින් ගාථා 9කුත් අළුතින් මෙහි දී එකතු කර ඇත. පසේ බුදුවරුන් නමින් හඳුන්වාදීමක් එහි දී සිදුනො වේ.

ථෙර අපදානයන් සැරියුත් හිමියන්ගෙන් අරඹා මුගලන්, මහාකාශ්‍යප, අනුරුද්ධ, උපාලි අඤ්ඤා කොණ්ඩඤ්ඤ, පිණ්ඩෝල භාරද්වාජ ආදි තෙරුන්ගේ අපදානවලින් යුක්ත වන අතර ථෙරි අපදානයෙහි මහාපජාපතී ගෝතමී, ඛෙමා උප්ලවණ්ණා, පටාචාරා, කුණ්ඩලකේශී, කිසා ගෝතමී, නන්දා ජනපද කල්‍යාණී, යසෝදරා, රූප නන්දා, අම්බපාලි ආදීන්ගේ අපදාන ඇතුලත්වේ. ඓතිහාසික තෙරවරුන් හා තෙරණියන්ට වඩා ථෙරාපදාන හා ථෙරි අපදානයේදී අපට හමුවන්නේ පුරා කෘත කුශල කර්‍මයන්ට අනුකූල වූ අන්වර්ථ නමකින් පෙනී සිටින වග්ගී චරිත ලක්ෂණ ඇති තෙරවරු හා තෙරණිවරු ය. මේ වූකලී තෙරවරුන්ගේ හා තෙරණිවරුන්ගේ සංඛ්‍යාව ගුණකර දැක්විය හැකි පහසුම ක්‍රමයකි. නිදසුන් වශයෙන් දක්වතොත් ථෙරි අපදානයේ ද සඳහන් වන නලමාලිකා එකපිණ්ඩදායිකා සත්ත උප්පලදායිකා, සාලමාලිකා උදකදායිකා, සත්තඋප්පල දයිකා සාලලත් ජ්ධිකා මොදක දායිකා ආදි තෙරණියෝ තමන් විසින් සසර සැප ලබා ගැනීම හා විමුක්තිය උදෙසා කරන ලද කුශල කර්‍මය තමන් පෙනී සිටින සංඥා නාමයෙන් ම ප්‍රකට කරන්නාහ.

ථෙරාපදානයේ සඳහන් වන පුබ්බකම්ම පිලොතික අපදානය වූකලි කිසියම් ථෙර කෙනෙකුන්ගේ අපදානයක් නොව, අප මහ බෝසතුන් පෙර කරන ලද අකුශල කර්ම නිසා බුදු වූ පසුත් එම විපාකාවශෙෂයන් විඳින්ට සිදු වූ අයුරු ප්‍රකාශ කරන අපදානයකි. එහි සඳහන් වන පරිදි 1. සුන්දරී පරිබ්‍රාජිකාවගේ හා 2. දෝෂාරෝපන 3. දේවදත් ගල් පෙරළීම 4. දෙව්දත් මිනීමරුවන් යෙදවීම 5. දෙව්දත් නාලාගිරි මෙහෙයවීම 6. ගල් පතුරක් වැදී උඩු පතුල තුවාල වීම 7. හිසේ රුදාව ඇතිවීම 8. වේරඤ්ජාවේදී අශ්ව ආහාර වැළඳීමට සිදු වීම 9.මහළු වයසේදී පිට කොන්දේ අමාරුවක් ඇතිවීම 10. ලෝහිත පක්ඛන්දිකා රෝගය වැළඳීම 11. සා අවුරුද්ද දුෂ්කර ක්‍රියා කිරීම යන මේවා කර්ම විපාකාවශේෂයන් වශයෙන් බුදුරදුන්ට විඳින්නට සිදුවිය. එහෙත් බුදුරදුන්ට අකුශල විපාක නොදුන් බව මිලින්ද ප්‍රශ්නයේ දැක්වෙන හෙයින් ථෙරවාද සම්ප්‍රදාය තුළ ම මේ පිළිබඳ මත භේද පැවති බව මින් පෙනේ.

ථෙරාපදානයේ සඳහන් වන අපදාන හා අටුවාවේ දක්නට ලැබෙන අපදාන අතර දිස්වන විසදෘශතා පොල්වත්තේ බුද්ධ දත්ත නාහිමියන් විසින් පෙන්වා දෙමින් මෙසේ කියා ඇත. "මෙසේ නම් එකක් දෙකක් නො ව සිය ගණනක් වෙනස් වී යාමට හේතුව කුමක්දැ?යි විමසිය යුතු ය. ඒ වෙනස් කම් අන්‍ය අපදාන පාලියට තිබුණාහයි කියනු මිස වෙන කිව යුත්තක් නො පෙනේ." යනුයි.[6] පෙළ හා අටුවාව සඳහන් කරන අපදාන සංඛ්‍යාව පිළිබඳ වෙනස ආචාර්ය ඔලිවර් අබේනායක විසින් ද පෙන්වා දී ඇත.[7] විසුද්ධජන විලාසිනී නැමැති අපදාන අටුවාව අටුවා කරන්නේ ථෙරාපදානය පමණි. ථෙරී අපදානයට අටුවාවක් විද්‍යාමාන නො වේ. මේ නිසා සමහර විට ථෙරී අපදානයට කිසි ම කලෙක අටුවාවක් සම්පාදනය වී නො තිබෙන්නට ඇතැයි ආචාර්ය ගොඩකුඹුර කල්පනා කරයි.[8]

## අපදාන පාලියේ කාලනිර්නය කිරීමේදී

අපදානය පාලිය සම්පාදනය කරන ලද කාලය නිර්ණය කිරීමේදී සැළකිල්ලට බඳුන් විය යුතු කරුණු කීපයකි. ඛුද්දක නිකායට අයත් ධම්මපද සුත්තනිපාත ජාතකපාලි ආදි කෘතිවලට



වඩා අපදාන පාලිය පශ්චාත් බවට විවාදයක් නැත. දීඝභාණක ඛුද්දක ග්‍රන්ථ නාමාවලියට එය ඇතුළත් නො කිරීමද ඊට එක් සාධයකයක් විය හැකි ය. එක් අතකින් බුදු දහම ජනප්‍රිය ලක්ෂණයන්ගෙන් අනූන ප්‍රායෝගික දහමක් වශයෙනුත් අනික් අතින් දාර්ශනික වශයෙන් සංවර්ධනයට භාජනවීමක් සිදුවෙමින් බුදුදහම විකාශනයට ගොදුරු ව පැවති යුගයක් මින් පැහැදිළි වේ. මෙහි දැක්වෙන විවිධ ආගමික සංකල්ප තුලනාත්මක ව විමර්ශනය කරන විට ඒවායේ නව්‍ය ස්වරූපය ඉඳුරා පැහැදැලි වේ.

බෝධි වන්දනාව, චෛත්‍ය වන්දනාව, පහන් පූජා, මල් පූජා ආදී පූජා විධි ජනතාව අතර සම්මානනයට පාත්‍ර වූයේ බුදුරදුන් පිරිනිවීමෙන් සියවස් කීපයක් ගතවුණු පසු ය. නානා විධ දෙවිවරුන්ට පුද පූජා හා වන්දනා මානන පැවැත්වූ ඉන්දීය සමාජයට ක්‍රමයෙන් ව්‍යාප්ත වෙමින් පැවති සිය සමයට අනුකූල ලෙස විකල්ප වන්දන මානන විධි පිළිබඳ ව බෞද්ධයන්ට සිතන්නට සිදුවිය. ඒ නිසා ඒ සඳහා විවිධ වන්දනා ක්‍රම බිහි කරනු ලැබී ය. ශ්‍රී මහා බෝධිය බෞද්ධයන්ගේ ගෞරවාදරයට පාත්‍ර වන්නේ බුදුන් වහන්සේ එම බෝධි මූලයේදී එහි සිහිල් සෙවන ලබමින් සම්‍යක්සම්බෝධිය අවබොධ කළ නිසා ය. එහෙත් බුද්ධත්වය ලැබීමෙන් පසු ඉකුත් වූ කාලය තුළ උන් වහන්සේ ශ්‍රී මහා බෝධිය වෙත පැමිණි බවට කිසිදු සඳහනක ත්‍රිපිටකයේ විද්‍යාමාන නොවේ. අශෝකයන් පැමිණ වඳින මානන කරන තුරු බුදුන් වහන්සේ බුදු බව ලැබූ ශ්‍රී මහා බෝධිය වෙත පැමිණ වැඳුම් පිදුම් කිරීමේ සිරිතක් හෝ බෞද්ධයන් අතර තිබුණු බවට සාධක විද්‍යාමාන නොවේ. මෙපමණක් නොව චෛත්‍ය වන්දනාව ද ජනප්‍රිය කරන ලද්දේ අශෝකයන් විසිනි. කාල්සි ගිරි ලිපියේ සඳහන් වන පරිදි අශෝක රජුගේ ධර්මයාත්‍රාවට බුද්ධගයාව ඇතුළත් ව තිබුණි.[9] විශේෂයෙන් අභිෂේකයෙන් විසි වැනි වර්ෂයේ දී ලුම්බිණියට ගිය බව සඳහන් වේ. මේ නිසා අපදාන පාලියේ කාලය නිර්ණය කිරීමේදී පාරිහාරික වශයෙන් බුදුසමය ජනප්‍රිය වීමට තුඩු දුන් හේතු කෙරෙහි ද සැළකිල්ල යොමු විය යුතු වේ.

අංක 486 දරණ අපදානය ඒ හා සම්බන්ධ පුරාවෘත්ත සමඟ සසඳමින් සමහර අපදාන සංස්කෘත අවදානවලට වඩා නව්‍යතම බව ඊ.මිම්ලර් විසින් පෙන්වා දෙන ලදි. සිල්වන් ලෙවි ථෙරි අපදානයේ එන මහා ප්‍රජාපතී ගෝතමී අපදානය කුමාරලාතගේ කල්පනා මණ්ඩිතිකාවන් සමඟ සසඳමින් ථෙරී අපදානයේ මහා ප්‍රජාපතී ගෝතමී අපදානය රචනය කළ තැනැත්තා සංස්කෘත පිටපත ගැන දැනගෙන සිටි බව කියයි. එහෙත් වින්ටනිට්ස් කල්පනා කරන්නේ දෙදෙනා ම ස්වකීය රචනයක් සඳහා වෙනත් මූලාශ්‍රයකින් කරුණු ගන්නට ඇත කියා ය.[10]

බුද්ධ විද්‍යාවේ දියුණු වූ අවස්ථාවක් අපදාන පාලියෙන් පිළිඹිබු වේ. කකුසඳ, කෝනාගමන හා කස්සප යන තුන් බුදුවරයන් ගැන සංයුක්ත නිකාය ආදී මූලික පෙළ පොත්වල සඳහන් වේ. මේ හැර එම බුදුවරුන් තෙනමට මුලින් වැඩ සිටි බව සළකනු ලබන විපස්සී, සිඛී, වෙස්සභූ යන බුදුවරුන් තෙනමක් ඇතුළු ව මෙකප පහළවූහ'යි සැළකෙන බුදුවරුන්තෙනම ගැන දීඝනිකායේ මහා පදාන සූත්‍රයේ විස්තර ඇතුළත් වේ. මෙම බුදුවරුන් පිළිබඳ ඓතිහාසිකත්වය සැකයට භාජනය වන නමුදු අශෝක රජු විසින් තමාගේ අභිෂේකයෙන් 14 වන වර්ෂයේදී කෝනාගමන බුදුරදුන්ගේ ස්තූපය දෙවන වරට වර්ධනය කළ බවත් 20 වන වර්ෂයේදී එම ස්ථානයට වන්දනාවේ පැමිණි බවත් සෙල්ටැඹක සඳහන් කර ඇත.[11] ජාතක නිදනය මෙන් ම බුද්ධ වංසයත් අප මහා බෝසතුන් විවරණ ලබාගත් බුදුවරුන් සූවිසි නමක් ගැන කියයි. එම ලැයිස්තුව ඇරඹෙන්නේ දීපංකර බුදුරදුන්ගෙනි. මෙ නාම ලේඛනයට මුළින් තවත් බුදුවරුන් තෙනමක් එකතු කිරීමෙන් ගෞතම බුදුරදුන් සමඟ බුදුවරුන්ගේ සංඛ්‍යාව (28) විසි අටක් වේ. අටවිසි පිරිතෙහි සඳහන් වන්නේ එම විසි අට නම ය. ආචාර්‍ය රීස් ඩේවිඩ්ස් අපදානය ගැන සඳහන් කරමින් කියන ලද්දක් කෙරෙහි අපගේ සැළකිල්ල මෙහිදී යොමු කළ යුතු වේ. මෙය මෙසේ නම් අපදානය වූ කලී ත්‍රිපිටකයේ ඉතා ම නව්‍යතම කෘතිවලින් එකකි. අනික් අතින් සළකා බලන විට ද මීට සමාන නිගමනයකට බැස ගැනීමට හැකි වේ. ඓතිහාසික බුදුරදුන්ට පෙර සිටි බුදුවරුන් හනමක්



ගැන දීඝ නිකාය කියයි. පශ්චාත්තන ග්‍රන්ථ වන බුද්ධ වංස වැනි කෘති මෙම සංඛ්‍යාව විසිහතර දක්වා වැඩි කර ඇත. එහෙත් අපදානය සියලු බුදුවරුන්ගේ සංඛ්‍යාව තිස්පහක් බවට පත් කරමින් තව බුදුවරුන් එකොලොස් නමක් මේ ලැයිස්තුවට එකතු කර ඇත. මේ කෘතියේ එන විවිධ පුරා වෘත්ත විවිධ යුගවලට අයත් ඒවා විය හැකි ය. ඒවා ත්‍රිපිටකයට අයත් බොහෝ කෘති සම්පාදනය කළාට පසු අවස්ථාවක සකසා එකතු කළා විය හැක යනුවෙනි.[12]

අනන්ත අප්‍රමාණ බුදුවරුන් ගැන බුද්ධාපදානය පැහැදිලි ලෙස ම කියයි. බුද්ධ විද්‍යාවේ දියුණු අවස්ථාවක් ඉන් පිළිබිඹුවන බව නිසැක ය. මහායාන සංකල්පයක් වන සුඛාවතිය වැනි දිව්‍යලෝකයක රමණය කරමින් ඔවුනොවුන් ප්‍රශ්න අසමින් හා විසඳමින් ඉතා සුව පහසු ප්‍රීතිමත් ජීවිතයක් ගත කරන බුදුවරුන් ගැන එහි සඳහන් වන හෙයින් ථෙරවාදය තුළ දියුණු වූ බුද්ධ විද්‍යාවේ ලක්‍ෂණ ඉන් පෙන්නුම් කරයි.[13] එසේ වුව ද ථෙරි අපදානය සඳහන් කරන්නේ ඉහත සඳහන් කරන ලද බුද්ධනාමාවලියෙහි දහතුන්වන බුදුරදුන් වන පදුමුත්තර බුදුරදුන්ගේ පටන් බුදුවරුන් ගැන පමණකි. ග්‍රන්ථය අවසාන හරියේ එන යශෝදරා ථෙරි අපදානයේ පමණක් දීපංකර බුදුරදුන් ගැන කියවේ. එබැවින් ආචාර්‍ය රීස් ඩේවිඩ්ස් විසින් පෙන්වා දෙන ලද පරිදි අපදානයේ එන විවිධ පුරා වෘත්ත වෙනස් වෙනස් වකවානුවලට අයත් බව පිළිගැනීම යුක්ති යුක්ත වේ.

ඛෙමා ථෙරි අපදානය කථා වස්තුව ගැනත් අභිධර්මය ගැනත් කියන හෙයින් නිසැක ලෙස ම තෙවන සංගායනාවෙන් පසු අවධියක එය රචිත බව හෙළි වේ. මුල් නිකාය ග්‍රන්ථ භාෂාවෙන් හා ථෙර ථෙරි ගාථා භාෂාවෙන් ද වෙනස් වූ එමෙන් ම තෙවන සංගායනා යුගයට අයත් කථා වස්තුවේ උපයුක්ත භාෂාවට වෙනස්වූත් අපදානයේ භාෂාව බෞද්ධ සංස්කෘතයට තැකම් කියන සංගෘහීත ක්‍රියාපද හා සංස්කෘත තත්භව ශබ්ද බහුල භාෂාවකි. ශෛලිය ද ඒකාකාර ස්වරූපයක් දරයි.

එබැවින් මේ අනුව අපදානයේ පැනෙන සංවර්ධිත සංකල්ප දෙස තුළනාත්මක ව බලන විට අපදානය ක්‍රි:පූ: 3වන සියවස අවසන් භාගයේදී පමණ සකස් කරන්නට ඇතැයි සැළකිය හැකි ය.

## ථෙරී අපදානයේ පිළිබිඹුවන සාමයික චින්තා

එක් වර්ගියකට අපදාන දහය බැගින් යුත් අපදාන හතළිහක් ථෙරී අපදානයේ ඇතුළත් ය. එහෙත් අපදාන හතරකදී සාමාන්‍ය ක්‍රමය වන එක් භික්ෂුනියකට එක අපදානය බැගින් දක්වන ලද වෙනස්කොට එම හතරෙදී භික්ෂුණීන් සාමූහික වශයෙන් ගෙන භික්ෂුණීන් දස දහසක් (දස භික්ඛුණී සහස්ස) භික්ෂුණී දහ අට දහසක් (අට්ඨා රස භික්ඛුණී සහස්ස) යසවතී ප්‍රමුඛ භික්ෂුණීන් දහ අට දහසක් (යසවතී පමුඛ අට්ඨාරස භික්ඛුණී සහස්ස) හා බ්‍රාහ්මණ කන්‍යා භික්ෂුණීන් අසූ හතර දහසක් (චතුරාසීති භික්ඛුණී සහස්ස) යනුවෙන් දක්වා ඇත. භික්ෂුණීන් අතර අග තනතුරු ලැබූ මහාපඤ්ඤා ඛේමා, ඉද්ධිමන්ති උප්පලවණ්ණා, විනයධරා පටාචාරා, ඛිප්පාභිඤ්ඤා කුණ්ඩලකේශී, ලූඛචීවරධරා කිසාගෝතමී, ධම්මකථිකා, ධම්මදින්නා, දිබ්බච ඛුකා, සකුලා, ආරද්ධවීරියා සෝණා, ධුතවාදිනී, භද්දාකාපිලානි, සද්ධාධිමුත්තිකා සිඟාලමාතා යන ඓතිහාසික තෙරණීන් පිළිබඳවත් පූරාකෘත කුශල කර්ම අර්ථවත් කරන සංඥානාමයන්ගෙන් හඳුන්වනු ලබන තෙරණීන් පිළිබඳවත් සඳහන් වන එම අපදාන සමාලෝචනය කරන විට බුදු දහමේ ජනප්‍රිය ලක්ෂණ පැහැදිළි ව දක්නට ලැබේ.

## ථෙරී අපදානයේ පැනෙනෙ ජනප්‍රිය ලක්ෂණ - ස්තූප වන්දනාව

ජනප්‍රිය බුදු දහමේ අනිවාර්‍ය අංගයක් බවට පත්වෙමින් පැවති ස්තූප වන්දනාව පිළිබඳ ව ථෙරී අපදානයේ කීප පලක ම සඳහන් වේ. මෙඛලාදායිකා සිද්ධාර්ථ බුදුරදුන්ගේ ස්තූපයට මෙඛලාවක් පුදා සසර අනන්ත සැපවිපාක ලබයි. භද්දාකාපිලානි පදුමුත්තර බුදුරදුන්ගේ චෛත්‍යය උත්කර්ෂයෙන් වර්ණනා කරයි. එම දීර්ඝ වර්ණනාවට (ගාථා 893 - 901) චෛත්‍යයේ අංගෝපාංග හා දර්ශනීය ආකෘතිය ද අයත් වේ. මේ හැර කාශ්‍යප බුදුරදුන්ගේ



ධාතු තැන්පත්කොට චෛත්‍යය නිර්මාණය කරද්දී සසර සැරි සරණ භද්දාකාපිලානි ඒ සඳහා රන් ගඩොලක් පූජා කළාය. එසේ ම වරක් පසේ බුදුවරුන් සඳහා ද ස්තූප කරවූවා ය. රූපනන්දා භික්ෂුණිය ධාතු ස්තූපයක් මත්තෙහි රන් පත්‍රයක් පුදා සසර සැප වින්දා ය. බුදුන් රහතුන්ගේ ශාරීරික ධාතු වන්දනාව ආනිසංශදායක ක්‍රියාවක් බව මින් ගම්‍යවේ. මහා ප්‍රජාපතී ගෝතමියගේ දේහය ආදාහන කළ පසු එතුමියගේ පාත්‍රයේ ම බහාලන ලද ශාරීරික ධාතු ආනන්ද හිමියන් විසින් බුදුරදුන් වෙත එළවනු ලබයි.ස්තූප වන්දනාව ධාතු වන්දනාව සමඟ අනිවාර්යයෙන් ම සම්බන්ධය ස්මාරක වශයෙන් ස්තූප ගොඩ නැංවීම ප්‍රාග් බෞද්ධ සිරිතක් බවට සැකයක් නැත. ජෛනයන් හා බෞද්ධයන් යන දෙපිරිස ම ස්වකීය සමයානුගත චින්තාවන්ට අනුකූල මෙම ස්මාරක විශේෂය ගොඩ නැංවීමෙහි නිරත වූහ. බුදුරජාණන් වහන්සේගේ ධාතු තැන්පත් කොට ඉදිකරන ලද ස්තූප වන්දනාව අරඹන ලද්දේ අශෝක රජු විසිනැයි ශ්‍රීමත් ජෝන් මාර්ෂල් තදින් ම විශ්වාස කළේ ය.[14] කෙසේ වුව ද අශෝකයන් විසින් ස්තූප වන්දනාව ජනප්‍රිය කරන ලද බව සැළකීම වඩා යුක්ති යුක්ත බව පෙනේ. බුදු සිරුර අදාහනය කිරීමෙන් අනතුරුව සමීප රාජ්‍ය අටක නියෝජිතයන් එම ශ්‍රේෂ්ඨ ශාක්‍ය පුත්‍රයාගේ ධාතු ඉල්ලා එවීම ඓතිහාසික පුවතක් බවට සැක නැත.[15]

ථෙරී අපදානයේදි ථූප හා චේතිය යන වචන දෙක අවිශේෂයෙන් යොදා ඇත. එකම අරුත දැනවීම සඳහා පර්‍යාය වශයෙන් එම වචන මෙසේ භාවිත කළ ද මුල දී එම වචන දෙක අරුත් දෙකක් දැනවීම සඳහා භාවිත කළ බව පෙනේ. බුදුන් රහතුන් උතුමන්ගේ ධාතු තැන්පත් කළ ගොඩැගිල්ල 'ථූප' යනුවෙන් මුලදී වෙසෙසා හඳුන්වනු ලැබී ය. පූජනීය ස්ථාන චේතිය යනුවෙන් හැඳින්විණ. ඒ නිසා වෘක්ෂ, පර්වත යනාදිය ද එනමින් හඳුන්වා තිබිණි. එබැවින් ස්තූපයක් චේතියක් ලෙස පසුව නම් කෙරුණ ද චේතියක් ථූපයක් ලෙස හැඳින්වුයේ නැත. අපදානය රචිත යුගයේදී යථෝක්ත විශේෂත්වය ගිලිහි ගොස්

තිබුණු බව පෙනේ. මහා පරිනිබ්බාන සූත්‍රය සඳහන් කරන්නේ ද ථූපාරහ පුද්ගලයන් ගැන මිස චේතියාරහ පුද්ගලයන් ගැන නො වන බව ද සැළකිය යුතු වේ.

## බෝධි වන්දනාව - මල් පහන් පූජා

පාරිහාරික බුදු දහමේ තවත් ජනප්‍රිය අංගයක් වන බෝධි වන්දනාව හෙවත් බෝධි පූජාව පිළිබඳ ව ද ථෙරි අපදානය අපට තොරතුරු ඉදිරිපත් කරයි.

පඤ්චදීකා ථෙරි අපදානයෙහි බෝධි වන්දනාව ගැන කියවේ. බෝධියෙන් ආලෝකය නිකුත් වේවා යි භක්තියෙන් යුතු ව අධිෂ්ඨාන කිරීම නිසා එම අදිටන සමෘද්ධ වූ අයුරු එහි දැක්වේ. සත් දිනක් බෝධි මූලයෙහි ම වාඩි වී හුන් පඤ්චදීපිකා අටවන දිනයෙහි පහන් පූජාවක් කරයි. එහි ප්‍රතිඵල විසින් ඇය සසර ඉතා ආශ්චර්‍ය්‍ය ජනක සැප සම්පත් ලැබූ බව කියවේ. පඤ්චදීප දායිකා අපදානයේ ද මෙය සඳහන් වෙයි. භද්දාකාපිලානි කසුප් බුදුන්ගේ ධාතු තැන්පත් කොට සත් යොදුනක් උසට බඳවන ලද රුවන්මය ස්තූපයට සුවඳ තෙල් වත් කොට පහන් පූජාවක් කළ බව සඳහන් වේ.

මල් පූජාව ආනිසංසදායක පුණ්‍යකර්මයක් ලෙස දැක්වේ. නලමාලිකා සිද්ධාර්ථ බුදුරදුන්ට හා මල් දමක් පුදා සසර සැප සම්පත් ලබා ගනියි. සල්ලපුප්ඵිකා සසරදී විපස්සී බුදුරදුන්ට සල්මල් පූජා කරයි. ඇය බලා සිටියදී ම බුදුන් වහන්සේ එම මල් සිඹීම නිසා සිත පහදවා ඇය පින්සිදු කර ගනියි. සාලමාලිකා සිද්ධාර්ථ බුදුරදුන්ට සල්මල් දමක් පිදුවාය. උප්පලදායිකාගේ නමින් ධ්වනිත වන පරිදි ඇය උපුල්මල් පූජා කොට උපුල්මල් පැහැයෙන් යුක්ත විය යුතු නමුත් ඇය සසර සැප විඳින්නේ භික්ෂූන් වහන්සේ නමකට ආහාර හා වස්ත්‍ර පූජා කිරීමෙනි. සත්ත උප්පලමාලිකා උපුල් මල් හතක් පූජා කිරීමෙන් බහුවිධ සම්පත් ලබාගනියි.



පූජා ද්‍රව්‍යයක් ලෙස සුගන්ධවත් හා වර්ණවත් මල් මුළදී භාවිත කළේ එහි ආකර්ශණීයත්වය හා පවිත්‍රත්වය මුල්කොට වුව ද විපස්සි බුදුරදුන් සල්මල් සිඹ සලල පුප්ඵිකාගේ පින වර්ධනය කිරීමේ පුවත ථෙරවාදයට නුහුරු අදහසකි.

මේ හැර මණ්ඩපදාන විහාරදාන ආදි පූජාවන් ගැන ද ථෙරි අපදානයේ දී කියවේ.

## කුසල සඤ්චය සඳහා ධර්මයාත්‍රා

ආගමික වශයෙන් වැදගත් කමක් ඇති පූජනීය ස්ථාන කරා යන වන්දනා චාරිකා ගැන ද ථෙරි අපදානය අපට කියයි. පඤ්චදීපිකා හා පඤ්චදීපදායිකා යන අපදාන දෙකෙහි දී ම කුසල් රැස්කිරීම සඳහා ආරාමයෙන් ආරාමයට ගිය' වන්දනා ගමන් ගැන කියවෙන බැවින්[16] වන්දනා චාරිකා ජනප්‍රිය වෙමින් පැවති වකවානුවක මෙම පද්‍ය නිබන්ධනය කරන ලද බව මොනවට පැහැදිලි වේ.

වන්දනාවේ යන්නේ කුසල් රැස් කර ගැනීම පිණිස ය. කුසල් සසර සැප ලබාගැනීම සඳහා ය. කරන ලද කුසල් කර්මයට අනුරූප විපාක සිය දහස් ගුණයෙන් වර්ධනය වී ලැබෙන අතර කෙලෙස් ප්‍රහාණයෙන් නිර්වාණාවබෝධයට ද එය ම හේතුවන අයුරු සෑම අපදානයක ම පාහේ පිළිබිඹුවන්නකි. කුසල සඤ්චය නිර්වාණාවබෝධය සඳහා උපායක් ලෙස අවධාරණය වීම පොදු ජනතාව තුළ බුදු දහම ජනප්‍රියවීමට හේතු වුනාට සැක නැත.

බුද්ධ චරිතය හා සම්බන්ධ අනුස්මරණීය ස්ථාන 'නැවත සොයා ගැනීම' කරන ලද්දේ විහාර යාත්‍රා වෙනුවට ධර්මයාත්‍රාවේ යෙදුණු අශෝක රජතුමා විසිනි. ජනතාව තුළ ආගමික භක්තිය දැනවීමට අශෝකයන් දෙවරක් ම සංවේදනීය ස්ථාන කරා වන්දනාවේ. ඒ ස්ථානයන්හි ස්මාරක පිහිටවීමත් අනුබලයක් විය. සිය සමයානුගත සිරිත් විරිත් ජීවමානව පවත්වා ගෙන යමින් ආගමික විග්‍රහය දියුණු කරගැනීමට ප්‍රබෝධක වශයෙන් ඒවා බෞද්ධයන් අතර ව්‍යාප්ත විය.

## සෘද්ධි ප්‍රාතිහාර්ය පෑම

සෘද්ධි ප්‍රාතිහාර්ය පිළිබඳ ව පෙළ පොතෙහි සඳහන් වේ. සතර වැනි ධ්‍යානය තෙක් සිත දියුණු කරගත් කවර කෙනෙකුට වුවත් තමන් කැමති නම් පඤ්ච අභිඥාවන් උපදවා ගත හැකි ය. සෘද්ධි විධඥානය එහි පළමුවැන්නය. සෘද්ධිමත් භික්ෂූන් අතර අග තනතුරු ලැබූ සේක් මුගලන් මහ රහතන් වහන්සේ ය. උන් වහන්සේ විසින් දක්වන ලද සෘද්ධිප්‍රාතිහාර්ය පිළිබඳ විස්තර පෙළෙහිත් අටුවාවෙහිත් දක්නට ඇත. ථෙර ගාථාවේ උන් වහන්සේගේ ප්‍රාතිහාර්ය හැකියාවන් ගැන කියවේ.[17] බුදුන් වහන්සේගේ කීම අනුව වරක් උන් වහන්සේ පාදයේ මාපටැඟිල්ලෙන් මිගාර මාතුප්‍රාසාදය සෙළවූ අයුරු සංයුක්ත නිකායේ පාසාදකම්පන සූත්‍රයේ දැක්වේ.[18] සෘද්ධිමත් භික්ෂුණීන් අතර අග තනතුරු ලැබුවෝ උප්පලවණ්ණා භික්ෂුණීන් වහන්සේ ය.

පිණ්ඩොලභාරද්වාජ රහතන් වහන්සේ විසින් එක් අවස්ථාවක රජගහ නුවර සිටුවරයා විසින් රිටකින් ඔසොවා තබන ලද සඳුන් පාත්‍රයක් සෘද්ධියෙන් ගොස් ගැනීම නිසා උන්වහන්සේ බුදුරදුන්ගේ දෝෂ දර්ශනයට ලක් වූ බව විනයෙහි එයි.[19] එහෙත් ථෙරී අපදානයේදී බුදුන් වහන්සේ විසින් ම තෙරණියන්ට සෘද්ධිප්‍රාතිහාර්යය පාන ලෙස කියන බව දැක්වේ.

ථෙරී අපදානයෙහි එන පරිදි පිරිනිවන් පෑමට අවසර ගැනීම පිණිස යන මහාප්‍රජාපතී ගෝතමී බුදුරදුන්ගේ අනුමතියෙන්ම සෘද්ධිප්‍රාතිහාර්ය පාන අයුරු දැක්වේ.[20] එසේ ම යසෝදරා භික්ෂුණියටත් සෘද්ධිප්‍රාතිහාර්ය ප්‍රදර්ශනය කොට පිරිසෙහි සැක දුරු කරන මෙන් බුදුන් වහන්සේ විසින් කී පසු එතුමිය සෘද්ධිප්‍රාතිහාර්ය පෑ බව දැක්වේ.[21] මේ අයුරෙන් ම උප්පලවණ්ණා භික්ෂුණියටත් සෘද්ධිප්‍රාතිහාර්ය පා පිරිසෙහි සැක දුරුකරන මෙන් බුදුන් වහන්සේ විසින් ම කියන ලද බව දැක්වේ. සෘද්ධි බලයෙන් කරන ලද ක්‍රියාවන් මෙහි දීර්ඝ වශයෙන් විස්තරවේ.

විශ්මයාවහ සෘද්ධි බලය පිළිබඳ මෙම පුරා කථා සැදැහැතියන් තුළ භක්තිය වර්ධනය කිරීමටත් එමගින් ඔවුනගේ මානසික අවශ්‍යතාවක් සපුරාලීමටත් උපයෝගී වූවා විය හැක.



කෙසේ වෙතත් මෙම භික්ෂුණීන් වැඩ සිටි යුගයෙන් මෑත භාගයක සිට මෙම පෙළහර කථා එම යුගය මත අධ්‍යාරෝපනය කරන ලද ඒවා ලෙස දිස්වන බව කිවයුතු වේ. එසේ ම මුල් බුදු දහම අනුව සෘද්ධිබල පෑමේ හැකියාව පඤ්ච අභිඥා උපදවා ගත් කවරෙකුට වුව ද පැවති බව පිළිගැනී තිබුණු බව ද අමතක කළ යුතු නො වේ.

## තෙරණින් ලත් සංසාරික සැපසම්පත්

තමන් විසින් කරන ලද පුරා කෘත කුසල කර්ම හේතුවෙන් කාන්තාවන් විසින් අත්පත් කරගන්නා ලද බව සම්පත් සෑම ථෙරී අපදානයක ම ඒකාකාර ස්වරූපයක් දරයි. ඒවා විශේෂයෙන් ස්ත්‍රී වර්ගයාට ම පොදු වූ ස්ත්‍රීන්ට ම පරමාදර්ශී වූ සැප සම්පත් ය. ස්ත්‍රී ආත්ම භාව ලබා ම සසරදී එම සැපසම්පත් ඔවුහු භුක්ති විඳිති. ස්ත්‍රී ආත්මයකදී ම මනෝප්‍රණිධානය තබා ගනිමින් හෙවත් ප්‍රාර්ථනාව තබා ගනිමින් දීර්ඝ සංසාරයෙහි ස්ත්‍රී ආත්මභාව ලබා ම උපදිති. පින්පල විසින් ඔවුහු සක්විති රජවරුන් ප්‍රදේශ රජවරුන් ආදීන්ට අගබිසෝ වී උපදිති. මෙසේ සැරිසරා අවුත් ස්ත්‍රී ආත්ම භාවයක් ලබා ම ඉපදී පැවිදි වී අතීත පින්පල දෙමින් රහත්ඵලය සාක්ෂාත් කරගනිති.

## මනෝප්‍රණිධානය හා සංසාර විමුක්තිය

අපදාන පාලියේ බුද්ධාපදානය ගැන සඳහන් කරමින් පූජ්‍ය පොල්වත්තේ බුද්ධදත්ත නාහිමියෝ ත්‍රිපිටකයේ අන් කිසි තැනක සඳහන් නො වන බුදුරදුන්ගේ මනෝප්‍රණිධානය පිළිබඳ ව අවධානය යොමු කරවමින් එය බුද්ධාපදානයට ම විශේෂ වූවක් ලෙස පෙන්වා දෙති.[22]

ථෙරී අපදානය ද මේ අදහස තරමක් දුරට ව්‍යාප්තව ඇත. දීපංකර බුදුරදුන්ගේ සිට ඉන් පසුව පහළ වූ බුදුවරුන්ගේ කාලවලදී කරන ලද අධිෂ්ඨාන හේතු කොට තෙරණියහු අග තනතුරු හා රහත් බව ලබා ගනිති. පත්ථනා, අධිකාර, චේතනා පණිධි, පණිදිධි යන වචනයන්ගෙන් මෙය හැඳින්වේ. තලමාලිකා,

ඛෙමා, පටාචාරා, කුණ්ඩලකේශි, ධම්මදින්නා, සීහාල මාතා ආදි තෙරණියෝ තමන්ගේ චෙතනා පණිධිය සමෘද්ධ වූ බව ප්‍රකාශ කරමින් උදන් අනති.

## කාව්‍යමය සංකල්පය

ථෙර ගාථාවේ මෙන් ස්වභාව සෞන්දර්‍ය වර්ණනා හෝ ථෙරි ගාථාවේ මෙන් පෞද්ගලික අනුභූතීන් කාව්‍යමය සංකල්පනා මෙන් චිත්‍රණය කිරීමක් හෝ ථෙර-ථෙරි අපදාන ගාථාවල දක්නට නොමැත. ඒකාකාර ශෛලියකින් ලිය වී ඇති අපදාන ගාථා පුනරුක්ති බහුල එක ම රටාවක් අනුගමනය කොට බඳනා ලද බැවින් ආශ්වාදනීය බවෙන් තොර වෙයි. මේ නිසා මෙහි එන ගාථා සැබවින් ම ඒ ඒ නම්වලින් පෙනී සිටින තෙර- තෙරණීන් විසින් රචනා කරන ලද්දේ ද? යන අදහස නිතැතින් ම පැන නගියි. අම්බපාලි අඩ්ඪකාසි ආදි තෙරණීන්ගේ නමින් සඳහන් වන අපදාන ථෙරි ගාථාවේ එම තෙරණීන්ගේ නමින් සඳහන් වන ගාථා සමඟ තුලනය කිරීමෙන් එය මැනවින් පැහැදිලි වේ.

ථෙරි අපදානයේ මහාප්‍රජාපතී ගෝතමී අපදානයට අයත් සමහර පද්‍ය අපදානයේ දැකීමට දුර්ලභ භාවිත ලක්ෂණයන්ගෙන් යුක්ත ය. ඒවා සැබවින් ම අනුවේදනීය ධ්වනියක් නගයි. එහි 257 සිට 265 තෙක් පද්‍ය මහාප්‍රජාපතී නැමැති බුද්ධ මාතාව තමන්ගේ ආධ්‍යාත්මය වර්ධනය කළ බුදුරදුන් වැඳ පිරිනිවන් පෑමට අවසර පතන අයුරු බෙහෙවින් සිත් ඇදගන්නා සුළු ශෛලියකින් දැකිය හැක.

## පාදක සටහන්

1. සුමංගල විලාසිනී (ස.හේ.මු) 11 පිටුව
2. බලන්න. B.C. Law.-History of Pali literature.p.7.
3. අපදානට්ඨ කථා (ස.හේ.මු) 85 පිටුව
4. M. Winternitz.- History of Indian Literature. Vol.II p.152
5. කතෘගේ 'ජාතක සන්දර්භය හා කතා රටාව' නැමැති කෘතිය බලන්න
6. පූජ්‍ය ඒ.පී.බුද්ධදත්ත නාහිමි - පාලි සාහිත්‍යය1



7. ආචාර්‍ය ඔලිවර් අබේනායක, A Textual and Historical Analysis of the Khuddaka Nikaya. p.167. footnotte.
8. C.E. Godakumbura. - Apadana Atthakatha. (PTS).
9. R.Basak.- Asokan Inscriptions. p.40.
10. M.Winternitz.- History of Indian Literature. Vol. II p.154
11. නිග්ලීවා ටැම්ලිපිය - R.Basak. Asokan Inscriptions.. p.152
12. ERE Vol I p.603
13. එකෙ බුද්ධෙ පුච් ඡන්ති එකෙ පුච් ඡන්ති සාවකේ අඤ්ඤමඤ්ඤංච පුච්ඡන්ති අඤ්ඤමඤ්ඤං ව්‍යාකරොන්ති තෙ

    එවං රති පුරමසමානා පාදෙ අභිරමන්ති තෙ බුද්ධාපදාන
14. Sir John Marshall.- Monuments of Sanchi p.21.
15. මේ පුවත දීඝ නිකායේ මහා පරිනිබ්බාණ සූත්‍රයේ විස්තර වශයෙන් එයි.
16. ආරමෙනච ආරාමං චරාමි කුසලත්ථිකා
17. ථෙර ගාථා අංක 1183 -
18. සං.නි. 269 සිට ධම්මපදට්ඨ කථා ii 153 පිටුවේ සිට හා බුද්ධවංසට්ඨ කථා 31 පිටේ සිට තවත් විස්තර ඇතුළත් වේ.

19 විනය iii 110 සිට මේ පුවත විස්තර වශයෙන් ධම්මපදට්ඨ කථා iii 201 පිටුවේ සිට එයි.

20. ඉද ධී අනෙකා දසෙ සසි - බුද්ධානුඤ්ඤාය ගොතමී
21. ඉද ධීංචාපි තිදසෙ සහි මමසාසන කාරිකෙ පරිසානඤ්ච සබ්බාසං කඩ්ඛං ඡින්දස්සු සාසනෙ
22. පූජ්‍ය ඒ.පී. බුද්ධදත්ත නාහිමි-පාලි සාහිත්‍යය i 116 පිටුව